
WWW.OLEVELAPI.COM

අවසන් සංශෝධන
ඇතුළත් කළ යුතුව ඇත

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2012

## ලකුණු දීමේ පටිපාටිය



# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. ප්‍රධාන පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ. මෙය පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් සඳහා අධාරකයක් ලෙස යොදා ගත හැකිය.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## උත්තර පත්‍ර ලකුණු කිරීම - පොදු ශිල්පීය ක්‍රම

පිළිතුරු පත් ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන්ම කළයුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

- උත්තර පත්‍ර ලකුණු කිරීමට රතුපාට පැන්සලක් හෝ රතු පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
- සෑම උත්තර පත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී පහත සඳහන් ක්‍රමය අනුගමනය කරන්න.

**0 1 2 3 4 5 6 7 8 9**

- ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

### බහුවරණ උත්තර පත්‍ර - කවුළු පත්‍රය

ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය පිළිතුරු පත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

අනතුරුව උත්තර පත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපීයන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලිව එය මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

කවුළු පත්‍රය පිළිතුරු පත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර √ ලකුණකින් ද, වැරදි පිළිතුර **X** ලකුණකින් ද වරණ තීරය අවසානයේ ලකුණු කරන්න. නිවැරදි ලකුණු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරය පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා: $\frac{60}{100}$ $\frac{20}{30}$

### ව්‍යුහගත රචනා හා රචනා උත්තර පත්‍ර

WWW.OLEVELAPI.COM

- අයදුම්කරුවන් විසින් උත්තර පත්‍රයේ හිස්ව තබා ඇති කොටස් හෝ පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

- ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොද ගත යුතුවේ.

කිසියම් අයදුම්කරුවකු විෂයයට නියමිත ප්‍රශ්න පත්‍ර එකකට (ප්‍රශ්න පත්‍ර තුනක් ඇති විෂයයන් හි එකකට හෝ දෙකකට) පමණක් පෙනී සිටි අවස්ථාවක දී ඉතිරි ප්‍රශ්න පත්‍රයට හෝ ප්‍රශ්න පත්‍රයන්ට ඔහු නොපැමිණි බව විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන්ව තිබේ නම් නොපැමිණි පත්‍රවලට අයදුම්කරු ලබා ඇති ලකුණු 00 ක් සේ සලකා එම අයදුම්කරුගේ අවසාන ලකුණු තීරණය කළ යුතුය.

උදාහරණ : - මුළු ලකුණු 100



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



| අවසාන ලකුණු | මුළු ලකුණු | I පත්‍රය 40 | II පත්‍රය 60 |
|---|---|---|---|
| 44 | 44 | AB | 44 |

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 200 | I පත්‍රය 100 | II පත්‍රය 100 |
|---|---|---|---|
| 31 | 62 | 62 | AB |

අවසාන ලකුණු නිර්ණය කළ නොහැකි අවස්ථා:-

කිසියම් විභාග මධ්‍යස්ථානයකට අයත් ඔබ ලකුණු කරන විෂයයේ අදාල උත්තර පත්‍ර පැකට්ටුව I හා II සියල්ලම ඔබ මණ්ඩලය වෙත ලැබී නොමැති නම් අවසාන ලකුණු නිර්ණය කළ නොහැකිය.
(උදා - ගණිතය විෂයය සඳහා ගණිතය I හා II වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් තිබේ. එහෙත් අංක 10 දරණ විභාග මධ්‍යස්ථානයෙන් ඔබ මණ්ඩලය වෙත ලැබී ඇත්තේ ගණිතය II උත්තර පත්‍ර පැකැට්ටුව පමණි.)
කිසියම් අයදුම්කරුවකුගේ උත්තර පත්‍ර I හෝ II හෝ III පැකට්ටුව තුළ නොමැති අවස්ථාවක දී හා ඔහු එම ප්‍රශ්න පත්‍රයට හෝ පත්‍රවලට නොපැමිණි බව ශාලාධිපති විසින් විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන් කර නොමැති අවස්ථාවක දී ද අවසාන ලකුණු නිර්ණය කළ නොහැකිය.

කිසියම් අයදුම්කරුවකුගේ උත්තර පත්‍රයේ සඳහන් විභාග අංකය හා ලකුණු ලැයිස්තුවේ සඳහන් විභාග අංකය නොසැසඳෙන අවස්ථාවක දී ද අවසාන ලකුණු නිර්ණය කළ නොහැකිය.

කිසියම් මධ්‍යස්ථානයක සියලුම අයදුම්කරුවනට පොදු වශයෙන් බලපා ඇති වරදක් සිදු වී ඇති අවස්ථාවක දී ද අවසාන ලකුණු නිර්ණය කළ නොහැකිය.

උදා - ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන කඩදාසි දෙකකින් හෝ කිහිපයකින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඇති අවස්ථාවක විභාග අපේක්ෂකයින්ට එක් කඩදාසියක් හෝ කිහිපයක් අඩුවෙන් දී ඇති අවස්ථා

**මෙවැනි අවස්ථාවලදී**

අවසාන ලකුණු නිර්ණය නොකර ලකුණු ලැයිස්තුවේ වෙනත් කරුණු තීරයේ අයදුම්කරුගේ විභාග අංකය ලියා "අවසාන ලකුණු නිර්ණය කළ නොහැක" යන සටහන යොදන්න. මෙම සටහන උත්තර පත්‍රයේ මුල් පිටුවේ පහළ කෙළවරේ ද යොදන්න. මේ පිළිබඳව ජර්නල් සටහනක් යොදන්න.

මෙවැනි අයදුම්කරුවන් පිළිබඳ මධ්‍යස්ථාන අනුව වෙන් වශයෙන් ."9" අයිඑම්එල් (9IML) අසම්පූර්ණ ලකුණු ලැයිස්තු පිළියෙල කරන්න.

මෙම ලකුණු ලැයිස්තු "9" අයිඑම්එල් (9IML) කවරය තුළ බහා ඇගයීම් මධ්‍යස්ථාන පරිපාලකට භාර දෙන්න.

WWW.OLEVELAPI.COM

කොටස් සඳහා දෙන ලකුණු ඒ ඒ කොටස අවසානයේ භාග සංඛ්‍යාවක් ලෙස දක්වන්න. උත්තරයකට ලැබුණු මුළු ලකුණු ලිවීමේ දී එක් එක් කොටස සඳහා ලැබුණු ලකුණු උත්තරය අවසානයේ නැවත ලියා ඒවා එකතු කොට දක්වා ඒ වටා කවයක් අඳින්න. නිදසුනක් වශයෙන් ප්‍රශ්න අංක 03 කොටස් තුනකින් යුක්ත නම් හා එක් එක් කොටසට හිමි උපරිම ලකුණු ප්‍රමාණය 05 නම්, ඒ අනුව අයදුම්කරු ලබා ඇති ලකුණු මෙසේ දැක්විය යුතුය.

i $\frac{4}{5}$ + ii $\frac{3}{5}$ + iii $\frac{3}{5}$ = 3 ——— $\frac{10}{15}$



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

සෑම උත්තරයකට ම දෙන මුළු ලකුණු උත්තර පත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළයුතුවේ. සියල්ලම ලකුණු කොට ලකුණු මුල් පිටුවේ සටහනක් කර අවසානයේ දී අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තර පත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තර පත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ගණන ඔබ විසින් මුල් පිටුවේ එකතු කර ඇති මුළු ගණනට සමානදැයි නැවත පරීක්ෂා කර බලන්න. ඒ ඒ ප්‍රශ්න පත්‍රයට ලබා ඇති ලකුණු ප්‍රතිශතයක් වශයෙන් දැක්විය යුතු අවස්ථාවල දී එසේ දක්වන්න. (ඇතැම් ප්‍රශ්න පත්‍රවලට නියමිත ලකුණු ගණන හා ප්‍රතිශත සමාන වන අතර, ඇතැම් ඒවායේ නියමිත ලකුණු හා ප්‍රතිශතය වෙනස් වේ.)

**අවසාන ලකුණු තීරණය කිරීම**

දින පැකැට්ටුවට අදාල සියලු ම උත්තර පත්‍ර එනම් I හා II (ඇත්නම් III) උත්තර පත්‍ර ලකුණු කර අවසාන වූ පසු එම උත්තර පත්‍රවලට අදාල ලකුණු අයදුම්කරුගේ II පත්‍රයේ මුල් පිටුවේ සටහන් කරන්න.

උදාහරණ :-

| (අ) | (ආ) | ඉ |
|---|---|---|
| (i) $\frac{54}{100}$ | (i) $\frac{22}{40}$ | (i) $\frac{60.5}{100}$ |
| (ii) $\frac{67}{100}$ | (i) $\frac{34}{60}$ | (i) $\frac{81}{100}$ |
| (iii) $\frac{36}{100}$ | | |
| 3 \| 157 | | 2 \| 141.5 |
| 52.33 | | 70.75 |
| 52% | 56% | 71% |

WWW.OLEVELAPI.COM

ඉහත උදාහරණවලින් දක්වෙන පරිදි දශම සංඛ්‍යා ලැබෙන අවස්ථාවල දී අවසාන ලකුණ පමණක් පූර්ණ සංඛ්‍යා ලෙස දක්වන්න. අවසාන ලකුණු ප්‍රතිශතයක් වශයෙන් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දැක්වීමේ දී ඉතිරිය 05 හෝ ඊට වැඩි නම් ඊළඟ පූර්ණ සංඛ්‍යාවට පැමිණ විය යුතුය. ඉතිරිය 0.5ට අඩුනම් නොසලකා හැරිය යුතුය. අවසාන ලකුණු ලෙස සැලකෙන්නේ එක් එක් අයදුම්කරුවන් එම විෂයයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම ලබා ඇති ලකුණුවල ප්‍රතිශතයයි. අවසාන ලකුණු II පත්‍රය මත අකුරින් ද ලියා දක්වන්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2010
21 - සිංහල භාෂාව හා සාහිත්‍යය I, II, III

අවසාන ලකුණු ගණනය

I පත්‍රය — ලකුණු 40 යි

I
1 වන ප්‍රශ්නය - ලකුණු 20 යි.
2 වන ප්‍රශ්නය - ලකුණු 25 යි.
3 වන ප්‍රශ්නය - ලකුණු 10 යි
4 වන ප්‍රශ්නය - ලකුණු 10 යි
5 වන ප්‍රශ්නය - ලකුණු 15 යි — ලකුණු 80 යි

III 1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්යයි. 5, 6 සහ 7 වන ප්‍රශ්නවලින් එකකට පිළිතුරු ලිවිය යුතුය.

1 වන ප්‍රශ්නය - ලකුණු 20 යි.
2 වන ප්‍රශ්නය - ලකුණු 20 යි.
3 වන ප්‍රශ්නය - ලකුණු 15 යි
4 වන ප්‍රශ්නය - ලකුණු 15 යි
5 වන ප්‍රශ්නය - ලකුණු 10 යි
6 වන ප්‍රශ්නය - ලකුණු 10 යි
7 වන ප්‍රශ්නය - ලකුණු 10 යි — ලකුණු 80 යි

එකතුව ලකුණු $\frac{200}{2}$ යි

අවසාන ලකුණු **100**

WWW.OLEVELAPI.COM

දෙවන හා තුන්වන පත්‍රවල ලකුණු දීම.

1. කොටස් ලකුණු, දකුණු පස ඇති තීරුවෙහි ලියා දක්වන්න.

2. ඒ ඒ ප්‍රශ්නයෙහි කොටස්වලට ලද ලකුණු උත්තරයේ අග ලියා එකතු කොට එය දකුණු පස තීරුවේ ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා :- $\frac{4}{8}$ $\frac{6}{12}$ $\frac{3}{5}$ (2 - $\frac{13}{25}$)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**අවසාන ලකුණු ඇතුළත් කිරීම.**

රතු ලකුණු ලැයිස්තු යොදා ගන්නා විට එහි දක්වෙන මුළු ලකුණු වන 300 යන්න වෙනස් කොට 200 සේ ලියා ගන්න.

**රතු ලකුණු ලැයිස්තු නොමැති විට අවසාන ලකුණු ඇතුළත් කිරීම.**

I ,II යන පත්‍රවල ලකුණු ඇතුළත් කිරීම සඳහා යොදා ගත යුත්තේ තුන්වන පත්‍රය සඳහා ඇති ලකුණු ලැයිස්තුව ය.

ලකුණු ලැයිස්තුවේ දක්වෙන අංක 12 තීරුව 3 වන පත්‍රයේ මුළු ලකුණු ගණන ඇතුළත් කිරීමට යොදා ගන්න. පත්‍ර තුනෙහි ම ලකුණුවල එකතුව එහි මුළු ලකුණු (200) තීරුවේ ද අවසාන ලකුණු (100) තීරුවේ ද සටහන් කරන්න.

**විශේෂ අවස්ථා**

තුන්වන පත්‍රය සඳහා ලකුණු ලැයිස්තු සපයා නොමැති නම් ඇගයීම් මධ්‍යස්ථානයෙන් අතිරේක ලකුණු ලැයිස්තු ලබා ගෙන III පත්‍රයේ ලකුණු එහි ඇතුළත් කරන්න.

එවැනි අවස්ථාවල දී I ,III පත්‍රවල මුළු ලකුණු II පත්‍රය සඳහා ඇති විස්තර ලකුණු ලැයිස්තුවේ ඇතුළත්කොට අවසාන ලකුණු ගණන 100 තීරුවේ ලියන්න. .

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## I පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

1. ලකුණු කිරීම සඳහා ඔබ පිළියෙල කර ගන්නා කවුළුපත ප්‍රධාන පරීක්ෂක ලවා සහතික කරවා ගන්න.

2. පළමුවෙන් ම උත්තර පත්‍රය පරීක්ෂා කර එක් එක් ප්‍රශ්නයක් සඳහා පිළිතුරු එකකට වඩා ලකුණු කොට ඇත්නම් හෝ ලකුණු කොට නැත්නම් හෝ වරණ හතර කැපී යන සේ ඉරක් අඳින්න.

3. සෑම උත්තරයක් ම හරි බව හෝ වැරදි බව හෝ පැහැදිලිව ම අදාළ ප්‍රශ්න අංකය මත ම ලකුණු කරන්න.

4. අපේක්ෂකයා ලකුණු කර ඇති පිළිතුරු මත හරි වැරදි ( √ / x ) ලකුණු යොදමින්න.

5. කවුළු පතේ ප්‍රශ්න අංක තීරය කවුළුවක් වන සේ කපා හැර එම තීරුවෙහි ම හරි හෝ වැරදි බව දක්වන්න.

6. කවුළු පතක් හෝ තීරු පතක් හෝ යොදා ගන්නා විට නිවැරදි සිහුම ගැන විශේෂයෙන් පරිස්සම් වන්න.

7. එක් එක් තීරුවෙහි නිවැරදි උත්තර සංඛ්‍යාව පහළට එකතු කොට ඒ ඒ තීරුවේ ම යටින් ලියා ඒවා එකතු නිවැරදි පිළිතුරු ගණන $\frac{..}{40}$ යි. ලකුණු පස අදාළ කොටුව තුළ ලියන්න.

8. ලකුණු එකතු කිරීම, එම මුළු ලකුණු 3 වන පත්‍රයේ සටහන් කිරීම යන අවස්ථාවල දී ඉතාමත් පරීක්ෂාකාරී වන්න.

9. ආදී ලකුණකින් උත්තර ලකුණු කර තිබුණ ද, උත්තර දීම සඳහා විශේෂ පත්‍රිකාව භාවිත නොකොට ප්‍රශ්න පත්‍රයෙහි ම ඉරි ඇඳීම ආදී වශයෙන් ලකුණු කොට තිබුණ ද පිළිගන්න.

---

## II, III පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

1. උත්තර පත්‍ර ඇගයීම ආරම්භ කිරීමට පෙර එක් එක් ප්‍රශ්නයකින් සන්සේරු කිරීමට අපේක්ෂා කරන හැකියාව කවරේ දැයි හොඳින් අවබෝධ කර ගත යුතුය.

2. එම හැකියා සම්බන්ධයෙන් අපේක්ෂකයා ප්‍රදර්ශනය කළයුතු ප්‍රවීණතා මට්ටම කුමක් ද යන්න අනුහුරු අභ්‍යාස කිරීමේ අවස්ථාවේදීත් ලකුණු දීමේ පටිපාටිය සාකච්ඡා කරන අවස්ථාවේදීත් පැහැදිලිව හඳුනා ගැනීම අවශ්‍ය වේ. මෙහි දී ප්‍රදර්ශනය විය යුත්තේ 11 වන ශ්‍රේණියේ අවසානයේ දී අපේක්ෂකයා ළඟා විය යුතු ප්‍රාප්ති මට්ටම ය. එහි දී ගුරුවරයෙකු වශයෙන් ඔබ සතු අත්දැකීම් ද ඔබගේ ප්‍රධාන පරීක්ෂකවරයා විසින් දෙනු ලබන උපදෙස් හා මඟ පෙන්වීම ද බොහෝ සේ ප්‍රයෝජනවත් වනු ඇත.

3. ලකුණු පැවරීමේ දී පරීක්ෂකවරුන් අතර සංගත බවක් තිබිය යුතුය. එකම උත්තරයකට පරීක්ෂකවරුන් කිහිප දෙනෙකු විසින් පවරනු ලබන ලකුණු අතර විශාල වෙනස්වීම් ඇතිවීම වළක්වා ගත යුතුය. මේ සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කිරීම මැනවි.

   (අ) ඉදිරිපත් කොට ඇති ලකුණු දීමේ පටිපාටිය එලෙස ම අනුගමනය කිරීම.
   (ආ) ප්‍රධාන පරීක්ෂකගේ උපදෙස් නිවැරදි ව වටහා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීම.
   (ඇ) විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති අත් පොතෙහි සඳහන් ශිල්පීය ක්‍රම ඒ අයුරින් ම භාවිත කිරීම.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / Department of Examinations, Sri Lanka

**21 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2012 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2012 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2012

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | I, II | පැය තුනයි |
| சிங்களமொழியும் இலக்கியமும் | I, II | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature | I, II | Three hours |

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** හිමි වේ.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිලිමත්ව කියවා, ඒවා ද පිළිපදින්න.

• අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තදකළු අකුරෙන් මුද්‍රිත** කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වරණය තෝරන්න.

1. **අතේ මාලුවා පැනීම** කෙනෙකුගේ දියුණුවට හිතකර නො වේ.
   (1) තමන්ට නොලැබෙන දේ ගැන සිහින මවා ගැනීම (2) තමන් වෙනුවෙන් වාසියක් සලසා ගැනීම
   (3) අනුන්ගෙන් උදව් ඉල්ලා සිටීම (4) තමන්ට ලද නොහැකි දේවල් ගැන සතුටුවීම

2. තරුණ සමිතියේ ලේකම්තුමා **කොන්ද කෙළින් සිටීමට** රුචියයි.
   (1) සදු සතා සමතලා සිටීමට (2) නිර්මාණශීලීත්ව හැකියාව ප්‍රදර්ශනයට
   (3) කුඩා දෙයක් විශාල කොට කීමට (4) අනුන් මුළා කිරීමට

3. නිලධාරීන් කරන සමහර වැඩවලට **ඇඟිලි ගැසීම** නොකළ යුතු බව සමිතියේ සභාපතිතුමා අවධාරණය කළහ.
   (1) උදව් කිරීම (2) වැරදි විවේචන කිරීම
   (3) වර්ණනා කිරීම (4) අලංකාරවත් කිරීම

4. විවිධ උපද්‍රව නිසා **මුළු ලෝකය ම අහිමිවුණත්** මිනිසා දිරියෙන් ජීවිතය ජය ගන්නේ ය.
   (1) පිය මිතුරන් අහිමි වූවන් (2) නිවසේ සිටි කොට හා දේපළ නැති වූවන්
   (3) සියලු නෑදෑ සම්පත් අහිමි වූවන් (4) යාන වාහන ආදිය සොරු පැහැරගත් සියන්

• අංක 5 සිට 7 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

5. විද්‍යා විෂයය සම්බන්ධයෙන් ඔහුට ඇත්තේ ........................ කුසලතාවකි.
   (1) විස්මයජනක (2) දූරදර්ශී (3) දයාර්ද්‍ර (4) සාමාන්‍ය

6. කඩිමුඩියේ පැහැදිලි ලෙස නිසා ඔහු ........................ විය.
   (1) අශාන්ත (2) ප්‍රමුදිත (3) විස්මිත (4) විසම්මිත

7. ඔහු ඉතා වැදගත් කාර්යයක ........................ ව සිටියි.
   (1) ව්‍යාප්ත (2) ව්‍යාවෘත (3) නිර්වාණ (4) ආවෘත

8. 'රුසියානු' යන වචනයේ ඇති **පිලි නිවැරදි ව** අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   (1) පාපිල්ල, ඉස්පිල්ල, ඇදපිල්ල, පාපිල්ල (2) පාපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල, පාපිල්ල
   (3) ඇදපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල, පාපිල්ල (4) ඇලපිල්ල, ඉස්පිල්ල, ඇදපිල්ල, පාපිල්ල

• අංක 9 සහ 10 ප්‍රශ්නවල සෑම පදයක ම **අක්ෂර වින්‍යාසය නිවැරදි ව** දැක්වෙන වරණය තෝරන්න.

9. (1) පෙළපාළි, ප්‍රශංසාව, ශ්‍රේණිය, ඇලපිල්ල (2) ජීර්ණෝද්ධාරණ, නිලහිර, අභිවාදනය, ව්‍යංගාර්ථය
   (3) දේශගුණය, නිශ්ශබ්දතාව, මුද්‍රිකෝර්ව, පාර්ශ්වය (4) සරල, ප්‍රතිඵලය, අභිනිෂ්ක්‍රමණය, අනභිමානීව

10. (1) වශීකෘත, පලාත, ප්‍රජාතාන්ත, ප්‍රවීණ (2) යථාර්ථවාදී, හෘදයංගම, දිලිසෙන, ශුභ
    (3) පරිශීලනය, විස්මිතවෙයි, කැළඹීම, ප්‍රශංසනීය (4) අභිලාෂය, සම්ප්‍රදාය, පාරිතෝෂික, නිරූපණය



[ දෙවැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

11. අකාරාදි පිළිවෙළට වචන යෙදී ඇති වරණය තෝරන්න.
(1) කවුලු, කසින, කසුන්, කපාල (2) ගරාඳි, ගරුඬ, ගගන, ගැලු
(3) ගොඩැලි, ගොඳුරු, ගොතලු, ගොගොරු (4) කැකිරි, කැකුළු, කැටුම්, කැකැටු

12. කොමාව සහ ප්‍රශ්නාර්ථ ලකුණ **නිවැරදි ව** යෙදී ඇති වරණය තෝරන්න.
(1) කුමක් සඳහා ද ? ඔබ, ගමට ගියේ (2) කුමක් සඳහා ද, ඔබ ගමට ගියේ ?
(3) කුමක් සඳහා, ද ඔබ ගමට ගියේ ? (4) කුමක් ? සඳහා ද ඔබ ගමට ගියේ,

13. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) පද්ම - කමල, කුමුදු, උපුල්, සියපත්
(2) දිනිඳු - සූර්ය, රවි, ජනනී, අම්දිනි
(3) හානි - ඌන, ක්ෂය, හීන, හර
(4) පොළොව - දෙරණ, ධරණී, මිහි, මේදිනී

14. මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අසතුට - ආහ්ලාදය, ප්‍රසාදය, ප්‍රමෝදය, තුෂ්ටිය (2) සත්‍ය - අසත්‍ය, සාවද්‍ය, මුසා, මිථ්‍යා
(3) නිර්ධන - සධන, ධනවත්, සවස්තුක, පොහොසත් (4) රාගී - විරාගී, විරතී, විරමණ, සරාගී

- අංක **15** සිට **17** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසට වඩාත් සමීප අදහස සහිත වරණය තෝරන්න.

15. එම ක්‍රියාවලිය **අනවරතයෙන්** සිදුවන්නකි.
(1) වරින්වර (2) අනිවාර්යයෙන් (3) නිරන්තරයෙන් (4) අනුපිළිවෙළින්

16. එම යන්ත්‍රය **ස්වයංක්‍රීය ව** ක්‍රියාත්මක වේ.
(1) කිසිවෙකුත් නොදැනුවත් ව (2) බාහිර මෙහෙයවීමක් නොමැති ව
(3) කම්පනයක් සහිත ව (4) විදුලියෙන් පණගැන්වීමක් සහිත ව

17. තෝරාගත් මාතෘකාව පිළිබඳ තොරතුරු තව දුරටත් **ගවේෂණය** කළ යුතු බව කාගේත් අදහස විය.
(1) ගැඹුරින් සොයා බැලීම (2) කෙටියෙන් දැක්වීම
(3) සවිස්තරාත්මක ව දැක්වීම (4) නිවැරදි ව ඉදිරිපත් කිරීම

18. **අව්‍යය සමාසය** සඳහා උදාහරණයක් සහිත වරණය තෝරන්න.
(1) ඇතැඳෑ (2) සහසැප් (3) අජීර (4) නිරිඹින්

19. 'තෛපොංගල් උත්සවයේ තෙවන දිනයේ දී ගවයාට කෙළෙහිගුණ දැක්වීම සිදුකෙරේ.'
ඉහත වාක්‍යයේ අන්තර්ගත **තද්ධිත** පදයක් වන්නේ,
(1) 'උත්සවය' යන්නයි (2) 'දැක්වීම' යන්නයි (3) 'සිදුකෙරේ' යන්නයි (4) 'තෙවන' යන්නයි

20. 'කාන්තාව' යන පදයේ **අනියමාර්ථ ඒකවචන අනුක්ත** පදය සහිත වරණය තෝරන්න.
(1) කාන්තාවන් (2) කාන්තාවක් (3) කාන්තාවක (4) කාන්තාවෝ

21. **මිශ්‍රක්‍රියා** පදයක් සහ **විධික්‍රියා** පදයක් පිළිවෙළින් යෙදී ඇති වාක්‍යය තෝරන්න.
(1) පය ඉක්මන්කර ගෙදර යන්න. (2) මග තොරතුරු දැන පිටත්වන්න.
(3) වෙණ වයන්න; ගී ගයන්න. (4) ගී අසමින් ගමන යන්න.

22. 'වැඳ සිනු පද කමල
සමිඳ ආ සතු සිය මුසිල'
ඉහත පද්‍ය අර්ධයෙහි '**වැඳ**' යනු
(1) පූර්ව ක්‍රියාවකි. (2) විධි ක්‍රියාවකි. (3) ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි. (4) ආශිර්වාද ක්‍රියාවකි.

23. 'සිසිවන වුවන ඉහ සුන ගෙනැති මිටින' යන පද්‍ය පාදයේ '**සිසිවන වුවන**' යනු
(1) යුගල පදයකි. (2) අතිශයෝක්තියකි. (3) රූපකයකි. (4) උපමාවකි.

24. 'අන්තර්ජාතික' යන වචනයෙහි '**අන්තර්**' යනු
(1) නිපාතයකි. (2) උපසර්ගයකි. (3) තද්ධිතයකි. (4) විශේෂණයකි.

25. ධන + ඊශ්වර, පර + උපකාර, අති + අන්ත, ප්‍රජා + උත්සව යන පද නිවැරදි ලෙස සන්ධි කර ඇති වරණය තෝරන්න.
(1) ධනේශ්වර, පරෝපකාර, අත්‍යන්ත, ප්‍රජෝත්සව
(2) ධනීශ්වර, පරූපකාර, අත්‍යන්ත, ප්‍රජෝත්සව
(3) ධනීශ්වර, පරූපකාර, අත්‍යන්ත, ප්‍රජේත්සව
(4) ධනේශ්වර, පරෝපකාර, අත්‍යන්ත, ප්‍රජෝත්සව



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- අංක **26** සිට **28** තෙක් ඇති ප්‍රස්තාව පිරුළු සඳහා වඩාත් ගැළපෙන අදහස ඇති වරණය තෝරන්න.

26. 'ඇඹ කිල්ල මාළුවා වගෙයි'
(1) සිදු වූ වැරැද්දට පිළියම් නොමැති වීම
(2) ඇමක් භාවිත කර මසුන් අල්ලා ගැනීම
(3) ගැළවීමට අපහසු ලෙස යමක හිරවීම
(4) කරදර අතරට තවත් කරදර එකතුවීම

27. 'සාළු කෙයි වළං සිඳින්නා වාගෙයි'
(1) විරුද්ධකාරයන් නොමැති තැන ස්වාමිත්වය මත කටයුතු කිරීම
(2) කතාවේ තරමට ක්‍රියාවෙන් කටයුතු නොකිරීම
(3) නිශ්ශබ්දතාව ආරක්ෂා කළයුතු තැන එය කඩ කිරීම
(4) අවශ්‍යතාව ඇත්නම් නොකළ හැකි දෙයක් නොමැති වීම

28. 'කිරි මුහුදට හඳ පෑව්වා වගේ'
(1) යහපත් යමක් ඉටුකිරීමට ගොස් අයහපත් දෙයක් සිදුවීම
(2) කෙනකුගේ යහපත් ගුණ මනාව ප්‍රදර්ශනය වීම
(3) අවශ්‍ය තැන දී පමණක් ක්‍රියාත්මක වීම
(4) සිදුවිය නොහැකි දෙයක් පිළිබඳ විස්තර කිරීම

- අංක **29** සිට **32** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි දී ඇති වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූල ව **නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) මම යහපත් පුරවැසියකු වන්නෙමි.
(2) ඔහුත්, මමත් ප්‍රදර්ශනය නැරඹීමට යන්නෙමි.
(3) සිසුහු පස්දෙනෙක් ජයග්‍රහණ ලැබූහ.
(4) මා උගත් පාසලේ දක්ෂ ක්‍රීඩකයන් ඇත.

30. (1) එක් අයෙක් විවාද කණ්ඩායමෙන් ඉවත් වූහ.
(2) සියොතුන් කැල මිහිරි හඬින් නාද දෙති.
(3) හිරු කිරණ වැදුණු පියුම්හු විකසිත වෙයි.
(4) අජිතා හෝ මම හෝ නගරයට යන්නෙමු.

31. (1) රියදුරන් පාරේ පරෙස්සමෙන් රිය ධාවනය කළ යුත්තෝ ය.
(2) මිනිසුන් වුවමනාවෙන් ම ඩෙංගු මදුරුවෝ බෝකරති'යි සෞඛ්‍ය පරීක්ෂකවරයා පැවසී ය.
(3) ඇත්තු සමග පැටවුන් ද වනයේ සැරිසරති.
(4) අප නිහතමානී වුවහොත් සියල්ලෝ ම අපට ආදරය කරති.

32. (1) වෛද්‍යවරියක වූ රාධා දක්ෂ ලේඛිකාවක් ද වූවා ය.
(2) ක්‍රීඩකයෝ ක්‍රීඩාපිටියේ පුහුණු වනවා මම දුටිමි.
(3) සමුළුව සඳහා රාජ්‍ය නායකයෝ පැමිණ ඇත.
(4) උදේ සවස දෙමාපියෝ නැමදීම මැනවි.

33. චීවර චෙත්තියේ දී 'හැන්නැදි රාල' යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) පෙරහැරේ ගමන් කරන්නන් අතර නායකයා ය.
(2) පෙරහැරේ හිමිකරු ය.
(3) චීවර වාඩියක නායකයා ය.
(4) චීවර සමිති ප්‍රධානියා ය.

- අංක **34** සිට **36** තෙක් ඇති ප්‍රශ්නවල මුලින් දී ඇති වාක්‍යයේ අර්ථයට වඩාත් සමීප අර්ථය සහිත වාක්‍යය තෝරන්න.

34. 'ස්වභාව ධර්මය සකස් වී ඇත්තේ සාමය හා සමගිය උදෙසා වන අතර අසමගිය මිනිසා විසින් නිර්මාණය කරගන්නකි.'
(1) සොබාදහම සාමයත් සමගියත් වෙනුවෙන් සකස් වී ඇතත් මිනිසා අසමගිය නිර්මාණය කර ඇත.
(2) සාමයත් සමගියත් සොබාදහමින් ලැබුණත් මිනිසා අසමගිය පතුරුව යි.
(3) අසමගිය මිනිසාගේ නිර්මාණයක් වන අතර සාමය හා සමගිය පරිසරයේ නිර්මාණයකි.
(4) සොබාදහම මගින් සාමය හා සමගිය මූර්තිමත් වන අතර අසමගිය මිනිසාගෙන් මූර්තිමත් වේ.

35. 'බස කෙලෙසමින් පොත් ලියන්නවුන් මෙන් ම ඒ පොත් හුවා දක්වමින් උඩගෙඩි දෙන්නවුන් ද භාෂාවට කරන්නේ පරම හතුරුකමකි.'
(1) භාෂාව කෙලෙසමින් පොතපත ලියන අය ද ඒ සඳහා උදව් කරන අය ද භාෂා විනාශයට වගකිව යුතු ය.
(2) බස කෙලෙසමින් පොතපත ලියන අය ද එබඳු පොත් අගය කරන අය ද බසට මහත් අවැඩක් සිදු කරති.
(3) භාෂාව කෙලෙසමින් පොත් ලියන අයත් ඒ පොත් පළකරමින් උදව් කරන අයත් පරම හතුරෝ වෙති.
(4) භාෂාවේ රීති නොසලකමින් පොත් ලියන අය ද ඒ පොත් පරිශීලනය කරන අය ද භාෂාවේ විනාශයට වගකිව යුතු ය.



[ අනෙක් පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

283617

36. 'ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙන් කෙරෙන්නේ ස්වභාව ධර්මය සහ මිනිසා අතර ඇති උත්තරීතර බැඳීමට හානියක් නොකර ජීවිත ගමන ගෙනයාමට රුකුලක් වීම යි.'
   (1) සොබාදහම හා මිනිසා අතර ඇති අන්‍යොන්‍ය සම්බන්ධතාව රැකගනිමින් ජීවත්වීමට අවශ්‍ය පහසුව සැලසීම ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ කාර්යභාරය යි.
   (2) සොබාදහමත් මිනිසාත් එකට බැඳ තබමින් ජීවිතය ගෙන යාමට අවශ්‍ය උපකාරය කෙරෙන්නේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙනි.
   (3) ආයුර්වේදයේ අරමුණ මිනිසා හා සොබා දහම අතර ඇති බැඳීම කඩ නොකොට ජීවත්වීමට අවශ්‍ය පහසුකම් සැලසීමයි.
   (4) සොබාදහම හා මිනිසා අතර ඇති උතුම් බැඳීම සුරකිමින් ජීවත්වීමට අවශ්‍ය පහසුව සලසාදීම ආයුර්වේදයෙන් ඉටුකෙරෙයි.

37. පහත සඳහන් වාක්‍ය ලිඛිත ව්‍යවහාරයට හැරවූ විට වඩාත් **නිවැරදි වාක්‍යය** දක්වෙන වරණය තෝරන්න.
   'අපි හොඳට පාඩම් කරන්නට ඇති කියල ගුරුතුමිය හිතුවා.'
   (1) අප විසින් හොඳින් පාඩම් කරන ලදැ'යි ගුරුතුමිය සිතුවෝ ය.
   (2) අප හොඳින් පාඩම් කළහ'යි ගුරුතුමිය සිතුවා ය.
   (3) අප හොඳින් පාඩම් කරන ලදැ'යි ගුරුතුමිය සිතුවා ය.
   (4) අපි හොඳින් පාඩම් කරති'යි ගුරුතුමිය සිතුවා ය.

38. 'සෙදනා ලොවිනා ලදුනා ලෙසිනා' යන පද පාදයේ නිවැරදි අර්ථය දක්වෙන වරණය තෝරන්න.
   (1) නාගලෝකයෙන් එකෙණෙහි ම ආවා වූ ස්ත්‍රීන් මෙන්
   (2) නාගලෝකයෙන් ආවා වූ දිව්‍යමය නාග කන්‍යාවන් ලෙසින්
   (3) ඇත් සමූහය අතරින් පැමිණි ඇතින්නියන් මෙන්
   (4) වනා ස්නානය කොට පැමිණි කාන්තාවන් ලෙසින්

39. 'ලංකාවට පැමිණි විජය කුමරු ඇතුළු පිරිසට කසපැන් සංග්‍රහයක් ලැබී ඇති බව මහා වංශයේ සඳහන් වේ.' මෙහි **කසපැන්** යනු
   (1) කසාය (2) කුරුම්බා වතුර (3) සිසිල් පැන් (4) තේ පැන්

40. 'වැඩි රාජකාරිය' නැතහොත් මුල් මංගල්ලේ නමින් රජරට ගැමි වහරේ එන අභිචාරාත්මක පූජා විධිය පොදුවේ හැඳින්වෙන නාමය
   (1) මුට්ටි නැටීම යි. (2) කොහොඹා කළේ නැටීම යි.
   (3) තාලුමුරය යි. (4) දිය කැපීම යි.

WWW.OLEVELAPI.COM





අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை

## අ.පො.ස. (සා.පෙළ) විභාගය 2012
க.பொ.த.(சா.தர)ப் பரீட்சை 2012

විෂයය / பாடம் } සිංහල භාෂාව හා සාහිත්‍යය    විෂයය අංකය / பாட இலக்கம் } 21

### ලකුණු දීමේ පටිපාටිය - I පත්‍රය
புள்ளி வழங்கும் திட்டம் - பத்திரம் I

| ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 4 | 21. | 4 | 31. | 4 |
| 02. | 3 | 12. | 2 | 22. | 1 | 32. | 1 |
| 03. | 2 | 13. | 1 | 23. | 4 | 33. | 2 |
| 04. | 3 | 14. | 4 | 24. | 2 | 34. | 1 |
| 05. | 1 | 15. | 3 | 25. | 4 | 35. | 2 |
| 06. | 4 | 16. | 2 | 26. | 3 | 36. | 4 |
| 07. | 2 | 17. | 1 | 27. | 1 | 37. | 2 |
| 08. | 2 | 18. | 3 | 28. | 2 | 38. | 1 |
| 09. | 3 | 19. | 2 | 29. | 3 | 39. | 2 |
| 10. | 2 | 20. | 3 | 30. | 2 | 40. | 1 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு ~~02~~ 01 බැගින් / புள்ளி விதம்

මුළු ලකුණු / மொத்த புள்ளிகள் ~~02~~ X 40 = ~~80~~ 40

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තර පත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டுள்ள உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| සිවරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை | 40 | I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி | 80 |
|---|---|---|---|



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය - II පත්‍රය

* ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

ප්‍රශ්න අංක - 01 - මුළු ලකුණු 20 යි.

අපේක්ෂණය - භාෂා පරිචය ඇගයීම

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ.

අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20 කි.

**(I) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

1. (i) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වන උෂ්මාක්ෂර **දෙකක්** ද ඕෂ්ඨජාක්ෂර **දෙකක්** ද ලියා දක්වන්න.

(ii) පහත සඳහන් වාක්‍යයෙහි වචන දෙකක අක්ෂර වින්‍යාසය වැරදි ය. එම වචන දෙක පමණක් නිවැරදි කර ලියන්න.
ප්‍රසිද්ධ ගායක-ගායිකාවන් රැසක් සහභාගී වූ සංගීත සංදර්ශණය කලට වේලාවට ආරම්භ නොවූ හෙයින් නිම කිරීමට සිදුවූයේ අළුයම් පහට පමණ ය.

(iii) පහත සඳහන් පද **දෙක** විසන්ධි කොට ලියන්න.

(අ) අත්කම් (ආ) කවීන්ද්‍ර

(iv) පහත සඳහන් පද **දෙක** කවර සමාසවලට අයත් දැයි නම් කරන්න.

(අ) අඹුදරු (ආ) මදපවන්

(v) (අ) 'ශිල්ප' යන පදයට 'ඊය' ප්‍රත්‍යය එකතු කිරීමෙන් 'ශිල්පීය' යන තද්ධිත පදය සෑදෙන්නාක් මෙන්, 'රූප' යන පදයට 'ඊය' ප්‍රත්‍යය එකතු කිරීමෙන් සෑදෙන තද්ධිත පදය කුමක් ද?

(ආ) 'පිය' යන පදයට 'ආණ' ප්‍රත්‍යය එකතු කිරීමෙන් 'පියාණ' යන තද්ධිත පදය සෑදෙන්නාක් මෙන් 'සිව්දූ' යන පදයට 'ආණ' ප්‍රත්‍යය එකතු කිරීමෙන් සෑදෙන තද්ධිත පදය කුමක්ද?

(vi) පහත සඳහන් වාක්‍ය දෙකෙහි තදකළු අකුරෙන් දක්වෙන පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.

(අ) වැව **පිරුණොත්** කෙත් වතු සරු වේවි.

(ආ) අම්මා බෙහෙත් **බී** නින්දට ගියා ය.

(vii) පහත සඳහන් පද **දෙකෙහි** විරුද්ධාර්ථ රූප ලියන්න.

(අ) උත්තම (ආ) ශීඝ්‍රගාමී

(viii) පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය දෙක කර්මකාරකයට හරවා ලියන්න.

(අ) සිසු නායකයෝ නව විදුහල්පතිනිය පිළිගනිති.

(ආ) ගුරුළුගෝමීහු අමාවතුර රචනා කළහ.

(ix) පහත සඳහන් වචන **දෙකෙහි** අනුක්ත රූප ලියන්න.

(අ) විද්වත්හු (ආ) මැණියෝ

(x) පහත සඳහන් කවි පේළි දෙකෙහි ඇති තදකළු අකුරෙන් දක්වෙන පද වර්ගය නම් කරන්න.

(අ) මිදුලේ පහන් පැලේ නිසර **සැලුණු** දල්ල නිවී ගොස් ය.

(ආ) සියන මිහිය එනු කොයි සිට දද සමනල කොයිනා

(ලකුණු 20 යි)

01: i. උෂ්මාක්ෂර - ශ, ෂ, ස, හ, ෆ

ඕෂ්ඨජාක්ෂර - ප, ඵ, බ, භ, ම, ඹ, උ, ඌ

ii. සංදර්ශනය, අලුයම (වාක්‍යයම නිවැරදිව ලියා තිබුණ ද පිළිගත හැකිය.)

iii. අ. අත් + කම් ආ. කවි + ඉන්ද්‍ර



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

iv. අ. දකාරාර්ථ/ ද අරුත්

ආ. විශේෂණ/ වෙසෙසුන් වෙසෙස්/ වෙසෙසුන් සමස්/ විශේෂණ පූර්ව පද සමාස

v. අ. රූපීය ආ. සිව්දාණ

vi. අ. අසම්භාව්‍ය ක්‍රියා/ අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා/ අසබ්භාවී කිරිය/ ආවස්ථික කෘදන්ත/ නෛපාතික ක්‍රියා/ ක්‍රියා නිපාත/ නිපාත ක්‍රියා

ආ. පූර්ව ක්‍රියා/ පෙර කිරිය/ නෛපාතික ක්‍රියා/ ක්‍රියා නිපාත/ ආවස්ථික කෘදන්ත

vii. අ. අධම, නීච, පහත්, හීන, දීන,

ආ. මන්දගාමී

viii. අ. ශිෂ්‍ය නායකයන්/ නායකයින් විසින් නව විදුහල්පතිනිය පිළිගැනේ/ පිළිගනු ලබයි./ පිළිගනු ලැබේ./ පිළිගනු ලබන්නීය/ පිළිගැනෙන්නීය.

ආ. ගුරුළුගෝමින් විසින් අමාවතුර රචනා කරන ලදි/ කෙරිණි/ කරනු ලැබිය/ කරනු ලැබිණි/ කරනු ලැබී/ කරන ලද්දේය/ කරනු ලැබුවේය.

ix. අ. විද්වතුන් ආ. මැණියන්

x. අ. (අතීත) කෘදන්ත/ ක්‍රියා නාම/ ප්‍රත්‍යයාර්ථ නාම/ පසරුත් නම්/ කිතක නාම/ කර්මකාරක කෘදන්ත ක්‍රියා

ආ. නිපාත

**ප්‍රශ්න අංක 02 - මුළු ලකුණු 25 යි.**

අපේක්ෂණය - සංශ්ලේෂණ හැකියාව මැනීම

WWW.OLEVELAPI.COM

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරින් වටහා ගත යුතුය. රචනයෙහි විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකිය. මාතෘකාවක් ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරින් මාතෘකාව සකස් කර ගැනීමට අපේක්ෂකයාට අවසර ඇත.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

2. පහත දක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන **වචන 250 කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ඕනෑ ම රටක ජීවත් වන මිනිසුන්ගේ චින්තනය, නිර්මාණශීලිත්වය හා කලාරසඥතාව පිළිබිඹු වන්නේ එරටට අයත් සාහිත්‍ය කෘති මගිනි. එහෙත් වර්තමානයේ ඉතා වේගයෙන් ව්‍යාප්ත වන රූපවාහිනිය, අන්තර්ජාලය වැනි විද්‍යුත් මාධ්‍ය නිසා මෙරට ළමයින් මෙන් ම වැඩිහිටියන් ද සාහිත්‍ය කෘති පරිශීලනයෙන් බැහැර වනු දැකිය හැකි ය. මෙහි අවසන් ප්‍රතිඵලය එතරම් ප්‍රශස්ත එකක් නොවනු ඇත.

(ආ) ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමයට දීර්ඝ ඉතිහාසයක් ඇත. ඒ බව විවිධ පුරාවෘත්තවලිනුත් ඓතිහාසික මූලාශ්‍රයවලිනුත් තහවුරු කරගත හැකි ය. දේශීය ප්‍රතිකාර විධි හා ඖෂධ වර්ග ආශ්‍රයෙන් සිදු කෙරෙන මේ වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමය පිළිබඳ මිනිසුන් දැනුවත් කොට, එය ව්‍යාප්ත කිරීමට සැලසුම් සකස් කිරීම කාලීන අවශ්‍යතාවකි.

(ඉ) ශ්‍රී ලංකාවේ සිදුවන රිය අනතුරු ප්‍රමාණය දිනෙන් දින ම ඉහළ යමින් පවතී. මහා මාර්ග පද්ධතියේ අඩුපාඩු මෙන් ම රියැදුරන්ගේ සහ පදිකයන්ගේ නොසැලකිලිමත් බව රිය අනතුරු බහුලවීමට බලපාන ප්‍රධාන හේතුසාධක වශයෙන් හඳුනාගෙන තිබේ. දැඩි නීතිරීති මෙන් ම රියැදුරන්ගේ හා පදිකයන්ගේ හැසිරීම ද රිය අනතුරු වළක්වා ගැනීම සඳහා බෙහෙවින් ම වැදගත් වේ.

(ඊ) මිනිසුන්ට මෙන් ම සතුන්ට ද මිහිපිට ජීවත් වීමට ඇත්තේ එකසමාන අයිතියකි. මස් - මාංශ අනුභවය පිණිස මිනිසුන් විසින් සත්තු ඝාතනය කෙරෙති. එසේ ම සුරතලුන් වශයෙන් සතුන් කූඩුවල හෝ වෙනත් ස්ථානවල හෝ සිර කොට තැබීමෙන් පීඩාවට ලක්කෙරේ. මේ සත්ත්ව හිංසනය පිටුදැකීම කෙරෙහි සැමගේ අවධානය යොමු විය යුතු ය. එමගින් සතුන්ට නිදහසේ ජීවත්වීමට ඇති අයිතිය තහවුරු වෙනවා මෙන් ම පරිසරයේ ජෛව විවිධත්වය ද සුරක්ෂිත වේ.

(ලකුණු 25 යි)

එක් එක් විස්තරයට අදාළ වන්නේ පහත සඳහන් ප්‍රධාන අදහස් ය.

(අ) සාහිත්‍ය රුචිය නංවමු.

(ආ) දේශීය වෛද්‍ය ක්‍රමයේ පුනරුදය

(ඉ) රිය අනතුරු ඇයි නිරතුරු?

(ඊ) සත්ත්ව හිංසනය පිටු දකිමු.

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි

| | | | |
|---|---|---|---|
| 1. | සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළු ව | - | ලකුණු 08 යි |
| 2. | සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | - | ලකුණු 12 යි |
| 3. | ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05 යි |

01. සාරවත්භාවය - ලකුණු 07 යි

විස්තරයට අදාළ වන සරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි

WWW.OLEVELAPI.COM

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවැතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි

මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතුය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

ව්‍යාකරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංග ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

*සැලකිය යුතුයි*

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200 ට වඩා අඩු වන කල්හි ඉහත දැක් වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කළ යුතුවේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (✖) ලකුණ යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් පැහැදිලි ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.

1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂ්‍යය : වාක්‍ය රචනය ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

ප්‍රශ්න අංක 03

අපේක්ෂණය : කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. එසේ ම සංස්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

WWW.OLEVELAPI.COM

3. පහත දැක්වෙන ඡේදය වචන **50 - 60** අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

18 සහ 19 වැනි ශතවර්ෂයන්හි සිදු වූ ඇතැම් සමාජ විපර්යාස සාහිත්‍යය කෙරෙහි බලපෑ බව ද එය අලුත් මුහුණුවරකින් සකස්කිරීමෙහි ලා උපකාරී වූ බව ද වර්තමාන සාහිත්‍යය දෙස විචාරාත්මකයෙන් බලන විට පෙනී යයි. යාන්ත්‍රික යුගයකට සරිලන පරිදි සමාජය හැඩ ගැසීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් එහි අලුත් පන්තියක් පැන නැංගේය- එනම් නාගරික මැද පන්තිය ය. වර්තමාන ලේඛකයන් බොහෝ සෙයින් බිහි වූයේ අලුතෙන් උද්ගත වූ මැද පන්තියෙන් ය. අතීතයෙහි සිට වැඩි වශයෙන් පැවිදි සඟුවරුන්ට භාර ව තිබූ ලේඛන කලාව ක්‍රමයෙන් ඔවුන්ගේ අතින් ගිලිහී ගිහි ලේඛකයන්ගේ අතට පැමිණෙන්නට පටන් ගති. මේ වූ කලී සාහිත්‍ය ලෝකයෙහි එක්තරා විප්ලවයක් ඇති කිරීමෙහි ලා සමර්ථ වූ සිදුවීමකි. පැවිදි ලේඛකයන්ගේ කෘතිවලට සාමාන්‍යයෙන් විෂය නොවූ ඇතැම් මාතෘකා ගිහි ලේඛකයෝ තම රචනාවලට වස්තු කොටගත්හ. බොහෙවින් ආගමික ස්වරූපයක් දරූ පැරණි සිංහල සාහිත්‍යය පොදු ජනයාගේ සාහිත්‍යයක් බවට පෙරළුණේ මේ සමාජ විපර්යාසයේ ප්‍රතිඵලයක් වශයෙනැයි කිව හැකි ය. කවියාගේ පෞද්ගලික හැඟීම් ගැබ් කොට රචනා කරන ලද ශෘංගාරාත්මක පද්‍ය විශේෂයක් සිංහලයෙහි පහළ වූයේ මේ සමාජ විපර්යාසයට අප සාහිත්‍යය ගොදුරු වූ ප්‍රථම අවස්ථාවෙහි ය. එනම් මාතර අවධියෙහි ය.

(ලකුණු 10 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 10 යි.

| | | |
|---|---|---|
| ලකුණු විග්‍රහය | - | මුළු ලකුණු 10 යි. |
| අන්තර්ගතය | - | ප්‍රධාන අදහස් සඳහා ලකුණු 05 යි. |
| වචන ගණන | - | ලකුණු 03 යි. (වචන 50 - 60 අතර තිබීම සෑහේ.) |
| ශිල්පීය දක්ෂතා | - | ලකුණු 02 යි. (ව්‍යාකරණ, අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ ආදිය) |

අපේක්ෂිත ප්‍රධාන අදහස් :

- 18, 19 සියවස්වල ඇති වූ සමාජ විපර්යාසය සාහිත්‍යයට ඇති කළ බලපෑම
- යාන්ත්‍රික යුගයකට අනුව සැකසුණු සමාජයේ ප්‍රතිඵලයක් ලෙස නාගරික මධ්‍යම පන්තියෙන් ලේඛකයින් බිහිවීම
- භික්ෂූන් භාරයේ පැවැති සාහිත්‍යය ගිහියන් අතට පත් වීම නිසා සාහිත්‍ය ලෝකයේ විප්ලවයක් ඇතිවීම
- ආගමික සාහිත්‍යය පොදු ජන සාහිත්‍යයක් බවට පරිවර්තනය වීම
- මාතර අවධියේ දී ශෘංගාරාත්මක පද්‍ය සිංහල සාහිත්‍යයට එක් වීම

වචන ගණන 65 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 60 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන ගණන 45 ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් පිරිනමන්න. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතුය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02 කි. වචන ගණනයේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 65 ට වැඩි කල්හි හෝ 45 ට අඩුවන කල්හි වචන ගණන සඳහා ලකුණු 01 ක් හෝ 02 ක් හෝ පිරිනමන්න.

ප්‍රශ්න අංක 04

අපේක්ෂණය - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධ හැකියාව මැනීම

**පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර සපයන්න.**

ශාස්ත්‍රාධිගමය පිළිබඳ පැරණි පිළිවෙත අනුව ඇදුරු පා සෙවණෙහි විනා අන් මාර්ගයකින් ශාස්ත්‍රොද්ග්‍රහණය කළ හැකි නො වී ය. එය ආචාර්ය ශිෂ්‍ය උභය පක්ෂය විසින් උත්කෘෂ්ට පරමාර්ථයෙන් වෙළී එක්විත් ව ඉටු කරන ලද උදාර සේවයකි. ආචාර්යවරයා හා ශිෂ්‍යයා අතර පැවැත්තේ මවුපියන් විෂයයෙහි වූ දයාලු බවකින් පරිපූර්ණ වූ සම්බන්ධතාවකි. මේ නියායෙන් ශිෂ්‍යයා විසින් ආචාර්යවරයා කෙරෙහි පැවතිය යුතු වත් පිළිවෙත්, ඇප උපස්ථාන කොටසක් මෙන් ම ගුරුවරයා ශිෂ්‍යයා කෙරෙහි පෙරළා දක්විය යුතු ආචාර විධි පද්ධතියක් ද විය. ගුරුවරයා ස්වකීය පුත්‍ර ස්ථානයෙහි ලා ශිෂ්‍යයා සැලකූ අතර ශිෂ්‍යයා ද ඔහුට පියකුට සේ ආදර සංග්‍රහ පැවැත්විය. මේ පිළිවෙත අනුව ශිෂ්‍යයාගේ සුචරිත වර්ධනයෙහි ලා ගුරුවරයාගේ ගුණ සමුදාය බෙහෙවින් ඉවහල් විය. ශිෂ්‍යයා විසින් ආචාර්යවරයා ඇප උපස්ථාන හා වත් පිළිවෙත් ආදියෙන් පුදන ලද්දේ උදක් සිය කැමැත්තෙනි. ගුරු පඬුරින් ආචාර්යවරයා පිදීම ද එවක පැවැති පිළිගත් චාරිත්‍ර ධර්මයක් වූයේ ය. ශාස්ත්‍රාධිගම කුසල සම්පන්න වූ ඡාත්‍රයාට තමා දත් සකල ශාස්ත්‍රය ම නොවළහා ඉගැන්වීම ආචාර්යවරයාගේ පරම යුතුකම විය. ශිෂ්‍යයා තමා අභිභවා යති යි සැකයෙන් ගුරුමුෂ්ටි වශයෙන් කිසියම් දැනුම් විශේෂයක් සඟවා ගැනීම ආචාර්යවරයකු අතින් සිදු විය හැකි වූ බරපතළ වරදකි. මේ වරද නූතනයෙහි ද ඇතැම් විට විද්‍යාමාන නොවන්නේ නො වේ. ශාස්ත්‍ර දානය ධනෝපායන මාර්ගයක් කර ගත් ගුරුවරයා සමාජය විසින් පිටු දක්නා ලදී. නිස්සරණාධ්‍යාශයෙන් ශාස්ත්‍ර දානයෙහි යෙදුණු මහඟු ආචාර්යවරයා සියල්ලන්ගේ ම ආදර ගෞරවයට පාත්‍ර විය.

(i) ආචාර්ය ශිෂ්‍ය උභය පක්ෂය විසින් උත්කෘෂ්ට පරමාර්ථයෙන් ඉටු කළ උදාර සේවය කුමක් ද?
(ii) ශිෂ්‍යයාගේ සුචරිත වර්ධනයෙහි ලා බෙහෙවින් ම බලපාන්නේ කුමක් ද?
(iii) සමාජය විසින් පිටුදකිනු ලබන්නේ කවර වර්ගයේ ගුරුවරු ද?
(iv) සියල්ලන්ගේ ම ආදර ගෞරවයට පාත්‍රවන්නේ කවර වර්ගයේ ගුරුවරු ද ?
(v) මෙහි සඳහන් 'ශාස්ත්‍රොද්ග්‍රහණය' හා 'ගුරුමුෂ්ටිය' යන වචනවල අර්ථ දක්වන්න.

(ලකුණු 10 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

අපේක්ෂිත උත්තර

i. ශාස්ත්‍රෝද්ග්‍රහණය/ (ශිල්ප ශාස්ත්‍ර) ඉගෙනීම/ ඉගෙන ගැනීම

ඇදුරු පා සෙවනෙහි පමණක් ශාස්ත්‍රෝද්ග්‍රහණය කිරීම

ii. ගුරුවරයාගේ ගුණ සමුදාය

iii. ශාස්ත්‍ර දානය ධනෝපායන මාර්ගයක් කරගත් ගුරුවරු

iv. නිස්සරණාධ්‍යාශයෙන්/ ලාභාපේක්ෂාවකින් තොරව/ වස්තු අපේක්ෂාවකින් තොර ව ශාස්ත්‍ර දානයෙහි යෙදුණු ගුරුවරු

- ශාස්ත්‍රෝද්ග්‍රහණය - ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීම/ ශිල්ප ඉගෙන ගැනීම/ අධ්‍යාපනය ලැබීම
- ගුරුමුෂ්ටිය - ගුරුවරයා සඟවා ගත් දැනුම

(සමාන අදහස් නිවැරදි උත්තරය සේ පිළිගන්න)

(එක කොටසකට ලකුණු 02 බැගින් ලකුණු 10 යි.)

ප්‍රශ්න අංක 05

*අපේක්ෂණය - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා*

5. දීර්ඝ කාලයක් සිට මේ ප්‍රදේශවාසීන්ගේ ජීවිතවලට මෙන් ම වගාකටයුතුවලට ද වනඅලින්ගෙන් බාධා පැමිණෙමින් තිබේ. පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලටත් සාමාන්‍ය මිනිසුන්ගේ එදිනෙදා කටයුතුවලටත් මෙමගින් එල්ල වන්නේ විශාල තර්ජනයකි. මෙම ව්‍යසනයට මුහුණ පා සිටින කහටගස්දිගිලිය ප්‍රදේශයේ බෝවිටිය ග්‍රාමයේ ප්‍රජා-වර්ධන සමිතියේ ලේකම් ධුරය හොබවන දිල්හාර රත්නායක ඔබ යයි සිතා, ගම්වාසීන් එකතු වී මෙම උවදුර මැඩපැවැත්වීම සඳහා සම්මත කර ගත් යෝජනා කහටගස්දිගිලිය අඩවි වන නිලධාරී වෙත දන්වමින් ඒවා කඩිනමින් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කෙරෙන ඉල්ලීමක් ද සහිත ලිපියක් සකස් කරන්න.
(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

**නොහොත්**

ප්‍රදේශයේ බහුල ව වැවී, ප්‍රයෝජනයට නොගෙන අපතේ යන පලතුරු වර්ග බෝතල්වලට අසුරා දෙස් - විදෙස් වෙළඳපොළවලට අලෙවි කිරීමෙන් ආදායම් උපයා ගත හැකි ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ඔබගේ යොවුන් සමිතිය විසින් තීරණය කර ඇත. ප්‍රදේශයේ පිළිගත් බැංකුවක් මූලාප්‍රතිපාදන ලබා දීමටත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අවශ්‍ය විශේෂඥ දැනුම ලබා දීමටත් එකඟතාව පළ කොට තිබේ. මෙම තොරතුරු ඇතුළත් කරමින් ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ-තරුණියන්ට මෙම ව්‍යාපාරයට සම්බන්ධ වීම සඳහා උනන්දුවක් ඇති කෙරෙන ආකාරයේ ආකර්ෂණීය අත් පත්‍රිකාවක් සකස් කරන්න.

(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

(ලකුණු 15 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

රාජකාරි ලිපිය

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි.

1. ආකෘතිය සඳහා ලකුණු - 04
2. අන්තර්ගතය සඳහා ලකුණු - 08
3. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු - 03

01. ආකෘතිය සඳහා (ලකුණු 04 යි)

| | | |
|---|---|---|
| යවන්නාගේ නම, තනතුර, ලිපිනය සහ දිනය | - | ලකුණු 01 |
| ලබන්නාගේ ලිපිනය | - | ලකුණු 01 |
| ආමන්ත්‍රණය (මාතෘකාවට පෙර යොදා තිබිය යුතුය) | - | ලකුණු 01 |
| මාතෘකාව සහ අත්සන | - | ලකුණු 01 |

(යවන්නාගේ තනතුර යවන්නාගේ ලිපිනය තුළ හෝ ලිපිය අවසානයේ හෝ සඳහන් වී තිබිය යුතුයි. රාජකාරි ලිපි සඳහා නිර්දේශිත ආකෘති 2 ම නිවැරදි සේ පිළිගන්න.)

02. අන්තර්ගතය සඳහා (ලකුණු 08 යි)

- මිනිස් ජීවිතවලට සහ වගා කටයුතුවලට අලින්ගෙන් බාධා ඇතිවන බව
  ලකුණු 02 (එක් කරුණකට ලකුණු 01 බැගින්)
- දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට හා මිනිසුන්ගේ එදිනෙදා කටයුතුවලට එමගින් තර්ජන එල්ලවන බව
  ලකුණු 02 (එක් කරුණකට ලකුණු 01 බැගින්)
- අලි උවදුරු මැඩ පැවැත්වීම සඳහා යෝජනා
  ලකුණු 02 (එක් කරුණකට ලකුණු 01 බැගින්)
- යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගන්නා ලෙස කෙරෙන ඉල්ලීම
  ලකුණු 02

WWW.OLEVELAPI.COM

03. ශිල්පීය දක්ෂතා සඳහා (ලකුණු 03 යි)

නිවැරදි අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ, විරාම ලක්ෂණ, පැහැදිලි අත් අකුරු, උක්ත ආඛ්‍යාත සම්බන්ධය, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න. නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි හෝ අනුපාතික ලකුණක් පිරිනමන්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

අත් පත්‍රිකාව

ලකුණු 15 යි. 1 2 3 යන අංග සඳහා ලකුණු
වෙන් වෙන්ව දී ලකුණු එකතුව ලබා ගන්න.

1. ආකෘතිය ලකුණු 04
2. අන්තර්ගතය ලකුණු 08
3. ශිල්පීය දක්ෂතා ලකුණු 03

1. ආකෘතිය

- මාතෘකාව ලකුණු 01
- නිර්මාණශීලී බව ලකුණු 01
- පළ කරන්නාගේ නම/ ආයතනය ලකුණු 01
- පළ කරන දිනය ලකුණු 01

2. අන්තර්ගතය

1. ප්‍රදේශයේ ප්‍රයෝජනයට නොගෙන අපතේ යන පලතුරු ඇති බව
ලකුණු 01
2. ඒවා බෝතල්වලට අසුරා දෙස් විදෙස් වෙළෙඳපොලට අලෙවි කළ හැකි බව
ලකුණු 01
3. එමගින් ආදායම් උපයාගත හැකි බව
ලකුණු 01
4. ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට යොවන සමිතිය තීරණය කර ඇති බව
ලකුණු 01
5. මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමට පිළිගත් බැංකුවක් එකඟ වී ඇති බව
ලකුණු 01
6. විශේෂඥ දැනුම ලබා දීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එකඟ වී ඇති බව
ලකුණු 01
7. ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ තරුණියන් සිටින බව
ලකුණු 01
8. ස්වයං රැකියා ව්‍යාපෘතියට ඔවුන් තුළ උනන්දුවක් ඇති කරවන සුලුබව
ලකුණු 01

3. ශිල්පීය දක්ෂතා (ලකුණු 03 යි)

නිවැරදි අක්ෂර වින්‍යාසය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, ව්‍යාකරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

➢ නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

(ලකුණු 15 යි)

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන් ව දී ලකුණු එකතුව ලබාගන්න.

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | III | පැය දෙකයි |
| சிங்களமொழியும் இலக்கியமும் | III | இரண்டு மணித்தியாலம் |
| Sinhala Language and Literature | III | *Two hours* |

## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය - III පත්‍රය

*වැදගත් : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.*

* 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

**ප්‍රශ්න අංක 01**

WWW.OLEVELAPI.COM

*අපේක්ෂණය* - *නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම*

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 20 යි.

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20 කි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. යම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එම අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "ඒ කියන්නෙ එදාට අපේ ගෙදර පේරම කඩයින්නෙ කියන එකයි."

(අ) ඉහත සඳහන් ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?

(ආ) ඉහත සඳහන් ප්‍රකාශය ඇතුළත් කෙටිකතාව නම් කරන්න.

(ii) "එසේ හෙයින් නුඹට ද කිසියම් පීඩාවක් නොවන සේ මුත් ගොඩ නගා ලිය නොහැක්ක."

(අ) ඉහත සඳහන් ප්‍රකාශය කරන ලද්දේ කා හට ද?

(ආ) මෙහි කියැවෙන 'පීඩාව' කුමක් ද?

(iii) ගුණ පුරුදු පෙර කල
දන් නොපා මෙසේ කී කල

(අ) ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(ආ) ඉහත කවියේ තද කළ අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම දක්වන්න.

(iv) "සඳුදට එළි වෙන තෙක් මට ඉවසුම් නෑ."

(අ) සඳුදට එළි වෙන තෙක් ඉවසුම් නොමැත්තේ කවුරුන් හට ද?

(ආ) සඳුදට එළි වෙන තෙක් ඉවසුම් නොමැත්තේ කුමක් කිරීමට ද?

(v) "මල්සර හට තී සපයන්නී
යොවුනන් සිත් ඉන් බැඳලන්නී."

(අ) 'සර' යන්නට සමාන පදයක් මේ කවියෙන් උපුටා දක්වන්න.

(ආ) 'මල්සර' යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද?

(vi) "පසුව රජ්ජුරුවෝත් මුන් පින් අසා ගෙන්වාලා මසු දහසක් දී පින් හැරගෙන ලත් පිනට සතුටු ව මහත් සම්පත් දී සිටු තනතුරු දුන්හ"

(අ) මෙසේ සිටු තනතුරු ලැබූයේ කවරෙක් ද?

(ආ) මේ පුද්ගලයා සිටු තනතුර ලැබීම සඳහා කළ පින්කම කුමක් ද?

(vii) (අ) මහුල් ප්‍රස්තාව නාට්‍යයේ එන නාන්දුවිසී සමඟ විවාහ වීමට බලාපොරොත්තුවෙන් සිටින පුද්ගලයාගේ නම කුමක් ද?

(ආ) ප්‍රහසන යනුවෙන් හැඳින්වෙන්නේ කවර ගණයේ නාට්‍ය ද?

(viii) (අ) කාව්‍යශේඛරයේ දක්වෙන බමුණා, තම දියණිය මහලු බමුණකුට සරණ පාවා දීමට තුඩු දුන් හේතුව කුමක් ද?

(ආ) එම ග්‍රන්ථය රචනා කෙරුණේ කිනම් රාජධානි යුගයක දී ද?

(ix) (අ) යසෝදරාවතට අනුව මහාමායා දේවිය සිහිනෙන් දුටු විල කුමක් ද?

(ආ) මේ විල මැද දී මහාමායා දේවිය ස්නානය කරවූයේ කවුරුන් විසින් ද?

(x) (අ) උත්තරෝලිය වස්තුවේ දක්වෙන ගොපලු දරුවා, සිඟා වැඩි තෙරුන් වහන්සේට දන් දුන්නේ කුමක් ද?

(ආ) 'දෙමව්ලා මැද' යනු කිනම් වේලාවක් ද?

(ලකුණු 02 × 10 = 20 යි)

WWW.OLEVELAPI.COM

*අපේක්ෂිත උත්තර*

i. (අ) රාහුල් ප්‍රු

(ආ) පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා/ පොළෝ කුහරයෙන් ආ මිනිසා

ii. (අ) රජගහ නුවර අසූ කෙළක් ධන ඇති සිටාණන්ට

(ආ) රෝගය සුව කිරීමේ දී විඳින්නට සිදුවන දුක් ගැහැට

iii. (අ) නොයෙකට තව කොලහල

සොඳයි පාවා ගනිමි මනකල



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(ආ) පෙර කාලයේ/ කාලයේ

සී සල්හි/ සී වේලාවේ/ සිදු අවස්ථාවේ/ සී විට

iv. (අ) සිරියාවතීට

(ආ) චිත්‍ර තරගයට ඉදිරිපත් වීමට

v. (අ) හී

(ආ) අනංගයා, මල්සරා, මින්දද, මලවී වැනි සමානාර්ථ පද

vi. (අ) බත් බැලයා/ භත්ත භත්තික සිටාණෝ /

(ආ) පසේ බුදුන්ට බත් තලිය පූජා කිරීම /

vii. (අ) ලව්නේරිස්/ වනිගසේකර රාලහාමිගේ ලව්නේරිස්

(ආ) සුඛාන්ත ගුණයේ නාවන/ සුඛාන්ත /

viii. (අ) ණය ගෙවාගත නොහැකි වීම/ ණය බර /

(ආ) කෝට්ටේ යුගයේ දී

ix. (අ) අනෝතත්ත විල/ අනවතප්ත විල/ අනවතත්ත විල

(ආ) කන්‍යාලියෝ දෙදෙනෙක්

x. (අ) (පිළිණි) කවු අලයක්

(ආ) මධ්‍යාහ්නයේ/ මහදවල්/ දවල් /

**ප්‍රශ්න අංක 02**

W W W . O L E V E L A P I . C O M

අපේක්ෂණය 1. නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය

2. පාඨයක අදහස තම බසින් ලියා දැක්වීමේ කුසලතාව ඇගයීම

ලකුණු විග්‍රහය 1. ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 20 යි.(එක් කොටසකට ලකුණු 05 බැගින්)

තද කළු අකුරින් ඇති එක් එක් වචනයකට, නිවැරදිව තේරුම් ලියා ඇත්නම් එක වචනයකට

ලකුණු 01 බැගින් - ලකුණු 02 යි

සමස්ත අර්ථයට - ලකුණු 03 යි



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) ඇඳගත් තදින් විදි සැර නොවැරැදී වැද
**හියපත් මුවෙන්** වැගිරෙන ලේ හැලි නොමඳ
බලවත් දුකින් වලපින හිමි නුඹ වැලැඳ
මගේ **නෙත් දියෙන්** සේදී ගෙනැ ගියේ වෙද

(ii) "ඒ **දුර්වච වූ** කාරණයෙන් ම නුවණැත්තන්ගේ බස් නොගෙන, සියුම් මුවහත් ඇති **ඛඩ්ගයෙන්** දෙපළු කොට නසන ලද්දූ ව මග වැටී ඔත්තෙහි වේ ද?"

(iii) "පදමට **වෙරළු මිණි කැට** පුළු විසුළ හැව
**ජෝතිය** ඇතුම් ගත් ළා තණ පිටිය උව
නැහැ පුඩු මහත් කොට මී ගොන් මුළුව හැව
සිහිදෙසි නැවුම් පුස්සෙහි වෙල් සුමුරු බව"

(iv) "එසල **කර්මාන්විත වූ ව්‍යාධීන්** හැර අවශේෂ වූ ව්‍යාධි, **එක ආලේප මාත්‍රාවකින්** අන්තර්ධාන වන තරම් වූ දිව්‍යමය ඖෂධ උගන්වන්නා වූ ශක්‍රයෝ ජීවකයන් සත් අවුරුද්දක් මුළුල්ලෙහි වෛද්‍ය ශාස්ත්‍රය උගන්වා නිම වූහ."

(ලකුණු 05 × 04 = 20 යි)

අපේක්ෂිත උත්තර

2. i. හියපත් මුවෙන් - හීය වැදුණු ස්ථානයෙන්, (තැනින්) / හිය වැදුණු තුවාලයෙන්
නෙත් දියෙන් - ඇස් කඳුළින්, නෙත්වලින් ගලන කඳුළෙන්/ කඳුළින්

ඇද ගත්තා වූ දුන්නෙන් තදින් විද්දා වූ හී සරය වැරදීමක් නොමැති ව වැදී, හීය වැදුණු ස්ථානයෙන් අඩුවක් නොමැති ව ගලා යන ලේ සමූහය (රුධිර ධාරා) ස්වාමීනි ඔබ වැළඳගෙන ඉතා දුකින් වැලපෙන මගේ දෙනෙත් කඳුළු දියෙන් සේදී ගෙන ගියා වේද?

ii. දුර්වච වූ - අකීකරු, නොහික්මුණු
ඛඩ්ගයෙන් - කඩුවෙන් / අසිපතින් / කගින්

ඒ නොහික්මුණු කාරණයෙන් ම නුවණ ඇති අයගේ කියුම් නොපිළිගෙන සියුම් වූ මුවහතක් ඇති කඩුවෙන් දෙපලු කොට විනාශ කරන ලද්දේ මහා මාර්ගයෙහි වැටී ඔත්තෙහි වේද?
(වැටී ගියේ වේද, වැටී සිටියේ වේද)

වෙරළු මිණි කැට :- වෛදූර්ය මාණික්‍ය කැබලි, කොළ පැහැති මැණික් කැබලි / වෛදූර්ය

ජෝතිය :- කාන්තිය, බැබලීම

iii. එක පිළිවෙළකට වෛදූර්ය මාණික්‍ය කැබලි විසිරී ගිය ආකාරය මතු කරන කාන්තිමත් ළා තණකොළ සහිත පිට්ටනිය මත හිඳින තරුණ/ශක්තිමත්/ නාඹර මී ගොන් සමූහය නාස් පුඩු මහත් කොට වෙල් යාය අසල නැවුම් සුවඳ විඳිති.

කර්මාන්විත වූ ව්‍යාධියක් - කර්මයට අනුව ඇතිවන ලෙඩක්,
කර්මානුරූප රෝගයක් (අසනීපයක්)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

| | | |
|---|---|---|
| එක ආලේප මාත්‍රාවකින් | - | එක් වරක් ගෑ (ආලේප කළ) සුළු බෙහෙත් ප්‍රමාණයකින් (පමණකින්) |

එකල්හි කර්මය අනුව ඇතිවන ලෙඩක් හැර වෙනත්/ අනෙකුත් ලෙඩ රෝග එක්වරක් (සුළු ප්‍රමාණයක්) බෙහෙත් ගැල්වූ පමණකින් මැකී යන තරම් වූ දිව්‍යමය බෙහෙත් උගන්වන ශකුයෝ හත් අවුරුද්දක් ඇතුළත ජීවකයන්ට වෙදකම උගන්වා අවසන් කළහ.

**ප්‍රශ්න අංක 03 - 07 තෙක්**

| | | |
|---|---|---|
| අපේක්ෂණය | ඇගයීම, ප්‍රත්‍යාගතය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම | |
| ලකුණු විග්‍රහය | 3, 4 ප්‍රශ්න අනිවාර්ය යි | ලකුණු 15 යි |
| | 5, 6, 7, ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතුය. | ලකුණු 10 යි |

3, 4 ප්‍රශ්නවල තෝරා ගත් ප්‍රශ්නයේ (i) හා (ii) කොටස් වෙන් වෙන් ව විස්තර සහිත ව ලියා තිබිය යුතුය. උදාහරණ දක්වමින් එක් පිළිතුරක් සේ ලියා තිබුණ ද ලකුණු දෙන්න.

| | | | |
|---|---|---|---|
| උදාහරණ 04 ට | - | ලකුණු 04 | ලකුණු 15 යි |
| සමස්ත විස්තරයට | - | ලකුණු 11 | |

- **3, 4 යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන 125ක් පමණ තිබීම සෑහේ.**

**ප්‍රශ්න අංක 03**

WWW.OLEVELAPI.COM

3. "යසෝදරාවත පාඨකයාගේ සම්භාවනාවට පාත්‍ර වන්නේ,
   (i) ගැමි වහරෙහි එන යෙදුම් හා
   (ii) පුනරුක්ති බහුල, සරල බස් වහරක් යොදා ගැනීම නිසා ය". එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

*(ලකුණු 15 යි)*

*අපේක්ෂිත උත්තරය*

3. (i) අදාළ පිළිතුරෙහි ගැමි වහරෙහි යෙදුම් දෙකක්වත් ඇතුළත් කරමින් විස්තරාත්මක පිළිතුරක් ඉදිරිපත් කර තිබිය යුතුය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

උදා : තුන් ජාමෙට පෙනුණා සඳමඬල මට
දණක් පමණ මල් අතුරපු දිව යහනේ
නේරංජනේ ඉස්නානේ නෑවිල්ලේ
දෙනෝදහක් අඟනෝ මට මල් නෙළුවා
මහ රජුනේ මොකදැයි ඔය දුටු සිහිනේ

(ii) පුනරුක්ති බහුල බස් වහරක් සඳහා නිදසුන් දෙකක්වත් සපයමින් රසවින්දනාත්මක භාෂා ශෛලියකින් ලියා තිබිය යුතුය.

උදා : මොන මොන දෙයක් දෝ නොදැනෙයි සුවාමීනේ

සුදසුන් නිරිඳුනේ මොකදැයි ඔය සිනේ
මහ රජුනේ මොකදැයි ඔය දුටු සීනේ

නේරංජනේ ගංගාවේ සුදු වැල්ලේ
නේරංජනේ ඉස්නානේ නෑවිල්ලේ

රන් යහනේ සැතපෙන කල බිසවුන්ට
රන් මාලාවක් තිබුණා යහන පිට

*(ගැළපෙන වෙනත් උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න. එක් කොටසකට උදාහරණ 2 ක් බැගින් දක්වා තිබීම ප්‍රමාණවත්ය.)*

| | |
|---|---|
| උදාහරණ සඳහා ලකුණු | 04 |
| සමස්ත විස්තරයට ලකුණු | 11 |
| මුළු ලකුණු | 15 |

**සැකසෙත්**

**'මැනවින් ශාස්ත්‍ර ඉගෙනීම පමණක් නොව, දුර දක්නා නුවණ, ඉවසිලිවන්තභාවය වැනි ගුණාංග වර්ධනය කර ගැනීම සාර්ථක ජීවිතයක් සඳහා වැදගත් වේ.' වේදබ්බ ජාතකයේ එන**

**(i) බමුණාගේ චරිතය හා**

**(ii) බෝධිසත්වයන්ගේ චරිතය ඇසුරෙන් උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.**

***(ලකුණු 15 යි)***

අපේක්ෂිත උත්තරය

(i) බමුණා මැනවින් ශාස්ත්‍ර ඉගෙන ගත් මුත් දුරදක්නා නුවණ හා ඉවසිලිවන්තභාවය වැනි ගුණාංගවලින් තොරවූ බව පහත උදාහරණ ඇසුරින් විග්‍රහ කර තිබිය යුතුය.

- අනාරක්ෂිත අවස්ථාවල ශිල්ප බලය පෙන්වීම
- බමුණා පළමු සොරුන් පිටුපස යාම
- ශිෂ්‍යයාගේ අවවාද ගැන නොසිතීම
- තම ජීවිතය ගැන පමණක් සිතා සතුරුවන් වැසි වැස්සවීම



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- අවසානයේ මරණයට පත්වීම වැනි කරුණු, දුර දක්නා නුවණින් තොරවූ බව දැක්වීම සඳහා ඉදිරිපත් කර තිබීම සැලේ.
- ශිෂ්‍යයා එනතුරු බලා නොසිට සත්රුවන් වැසි වැස්ස වීම
- උපාය ශක්තියක් නොමැතිව කෙසේ හෝ සොරුන්ගෙන් ගැලවීමට සිතීම යන අවස්ථා ඉවසිලිවන්තභාවයෙන් තොර බවට ඉදිරිපත් කළ හැකි කරුණු වේ.

(ii) බෝධි සත්ත්ව චරිතයේ උගත්කම පමණක් නොව දුරදක්නා නුවණින් හා ඉවසිලිවන්ත බවින් යුක්ත බව පහත සඳහන් උදාහරණවලින් ප්‍රකාශ වී තිබිය යුතුය.

- දුරදක්නා නුවණින් යුක්ත බව

උදා : ගුරුවරයා මුහුණ පෑ අනතුර කල්තියා දැන ගැනීම හා ඔහු බේරා ගැනීමට උපක්‍රම යෙදීම.

සොරුන්ගේ මානසික ස්වභාවය හා ක්‍රියාකාරීත්වය ගැන අවබෝධ කර ගැනීම.

- ඉවසිලිවන්ත භාවයෙන් යුක්ත බව :

උදා : තම ගුරුවරයා සොරුන්ට හසුවූ විට කලබල නොවී ක්‍රියා කිරීම

ගුරුවරයාගේ මෘත දේහයට සන්සුන් සිතින් උපහාර දැක්වීම

මහා ධනයක් ලබා මෙලොව හා පරලොව සැප ලැබීමට සමත් වීම

වැනි උදාහරණ

*(මෙම උදාහරණ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න. එක් කොටසකට උදාහරණ දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත්ය.)*

උදාහරණය සඳහා ලකුණු 04

සමස්ත විස්තරයට ලකුණු 11

(මුළු ලකුණු 15 යි)

WWW.OLEVELAPI.COM

**ප්‍රශ්න අංක 04**

4. (i) "අනුන්ගේ අදහස් තේරුම් නොගැනීම,
(ii) එකිනෙකාට තියුණු වන ලෙසින් කතා කිරීම, ගැටුම්වලට හේතු වේ." මඟුල් ප්‍රස්තාව නාට්‍යය ඇසුරෙන් එ කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පහදන්න.

*(ලකුණු 15 යි)*

අපේක්ෂිත උත්තරය

4. i. නාට්‍යය පුරා ම අදාල පාත්‍ර වර්ගයා එකිනෙකාගේ අදහස් තේරුම් ගැනීමට උත්සාහයක් නොදැරීම දක්නට ලැබේ.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

උදා :- නන්දාවතී විවාහ කර ගැනීමට ලව්නේරිස් පැමිණි කාරණය තෙපානිස් ගැඹුරින් වටහා නොගැනීම

නන්දාවතී විවාහ යෝජනාව අතරේදී ගවයන් ගැන කරාබහක් මතුකර ගනිමින් අනවශ්‍ය ගැටුමක් ඇති කිරීම

ලව්නේරිස් හා නන්දාවතී අතර ඇතිවන සංවාදයේ දී අන්‍යොන්‍ය අදහස් තේරුම් නොගැනීම වැනි උදාහරණ

ii. එකිනෙකාට නිගරු වන ලෙසින් කථා කිරීම

උදා :- ඉඩම් හබයේ දී තෙපානිස් , ලව්නේරිස් හා නන්දාවතී කෝපකාරී වදන් භාවිත කිරීම

ඔල්මාදකාරයෝ, බෙබද්දෝ

මතක නැද්ද උඹේ නැන්දා බාස් එක්ක පැනලා ගියා

තමුසෙගේ ආච්චි කුදී

උඹේ තාත්තා සුදු කප්පිත්තා

දඩබ්බරයා, ගොහොදුවා, නිවයා

කුඩුප්පුවා, වනචරයා වැනි යෙදුම්

(ඉහත උදාහරණ ද වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න. එක් කොටසකට උදාහරණ 2 ක් දක්වා තිබීම ප්‍රමාණවත්ය.)

උදාහරණ සඳහා ලකුණු 04

සමස්ත විස්තරයට ලකුණු 11

(එකතුව ලකුණු 15 යි.)

**සැහැල්ලේ**

**'පියසේන ඇසූ ප්‍රශ්නයක්' කවි පන්තියෙහි සාර්ථකත්වයට හේතු වූයේ,**

**(i) ළමා හැඟීම් දනවන බස් වහරක් භාවිත කිරීම හා**

**(ii) පදපද ආකෘතිය යොදා ගැනීම යි."**

**එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.**

**(ලකුණු 15 යි)**

i. පියසේන ඇසූ ප්‍රශ්නයක් කවි පන්තියේ සාර්ථකත්වයට ළමා හැඟීම් දනවන බස්වහරක් භාවිත කර ඇති අයුරු

- කුඩා දරුවන් තුළ ඇති දක්ෂකම් මතු කිරීම.

  හතේ අටේ වක්කරයෙන් ගණන් හදා සමත් වෙලා

- ළමා ලෝකයේ ඇති එකමුතු බව

  හවසට අත්වැල් බැඳගෙන කවි කියන්නෙ අපි දෙන්නා

- ළමා සිත්තුළ සුරතල් සතුන් කෙරෙහි ඇති ආදරය

  ලේනා ගැන පූසා ගැන කවි කියලා සමත් වෙලා



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- තමාට වටහා ගත නොහැකි සමාජ ගැටලු පිළිබඳ ප්‍රශ්න කිරීම

  තුනේ ඉඳපු මම හතරට යන්නේ කවදාද ඉතින් වැනි උදාහරණ

සරල බස්වහරක් ඔස්සේ කවි පෙළ රචනා වී තිබීම ගැන රස වින්දනාත්මක විස්තරයක් ඇතුළත් විය යුතුයි.

ii. දෙපද ආකෘතිය යොදා ගැනීම .

- ළමා ලෝකයේ අත්දැකීම් සරල ව පැවසීමට හැකි වීම
- කුඩා දරුවන්ට තාලානුරූප ව ගැයීමට පහසු වීම වැනි කරුණු ඔස්සේ උදාහරණ කවි ඇසුරෙන් රස වින්දනයක් කර තිබීම.

(මෙම උදාහරණ හෝ ගැළපෙන වෙනත් උදාහරණ නිවැරදි සේ පිළිගන්න. එක් කොටසකට උදාහරණ 2 ක් දක්වා තිබීම ප්‍රමාණවත් ය.)

උදාහරණ සඳහා ලකුණු 04

සමස්ත විස්තරයට ලකුණු 11

එකතුව ලකුණු 15 යි.

- **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න. උත්තරයක වචන 100ක් පමණ තිබීම සෑහේ.**

**ප්‍රශ්න අංක 05**

5. "ධනයෙන් නිසි ප්‍රයෝජන ලබා ගත හැකි වන්නේ නිවැරදි ආයෝජනය මගින් පමණකි." යන ප්‍රකාශය භත්තභතික සිටාණන්ගේ කතාවෙන් උදාහරණ තුනක් දක්වමින් විග්‍රහ කරන්න. *(ලකුණු 10 යි)*

WWW.OLEVELAPI.COM

*අපේක්ෂිත උත්තරය*

දෙමාපියන් රැස්කළ ධනය යෝග්‍ය පරිදි වියදම් කිරීමට ඉදිරිපත් වීමෙන් නිසි ප්‍රයෝජන ලබා ගත හැකි වේ. එය නිවැරදි ආයෝජනය යි. ගන්ධක කුමාරයා මේ ගැන නොසිතා ලක්ෂ ගණන් ධනය වියදම් කොට ආහාර අනුභවයට පමණක් සූදානම් වෙයි. එහෙත් බත් බැලයා තමන්ට ලැබුණු ස්වල්ප ආහාරය පවා අනුන්ගේ යහපත උදෙසා පරිත්‍යාග කළේය. එනම් පසේ බුදුන් වහන්සේට පූජා කිරීමයි. මේ නිසා ඔහු විවිධ සැප සම්පත් ලැබීමට සමත් විය. මේ කරුණට අදාළ ව සිදුවීම් තුනක් ඇසුරෙන් කරුණු දැක්වීම ප්‍රමාණවත් ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

බත් බැලයා තමාට ලැබුණු බත් තලිය සම්පූර්ණයෙන්ම පසේ බුදුන්ට දන්දීම.
ගන්ධක සිටුවරයාට පින් අනුමෝදන් කිරීම
රජුට පින් අනුමෝදන් කිරීම ආදිය

| | |
|---|---|
| උදාහරණ සඳහා | ලකුණු 03 |
| සමස්ත විස්තරයට | ලකුණු 07 |
| මුළු | ලකුණු 10 |

(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන කරුණු ඉදිරිපත් කර ඇත්නම් අදාළ ලකුණු පිරිනමන්න.)

## ප්‍රශ්න අංක 06

6. "කෙටිකතාවක සාර්ථකත්වයට ප්‍රධාන හේතුවක් වන්නේ මනාව සිද්ධි ගැළපීම හා අවස්ථා නිරූපණය යි." 'අපටත් දවසක ඉර පායා දේ' කෙටිකතාවෙන් උදාහරණ ඇසුරෙන් දක්වමින් මේ කියමන විමසන්න. *(ලකුණු 10 යි)*

අපේක්ෂිත උත්තරය

මෙහිදී අපටත් දවසක ඉර පායාදේ කෙටි කතාවේ සිද්ධි ගැළපීම් හා අවස්ථා සම්බන්ධය ඇසුරෙන් කරුණු දැක්විය යුතුය. මේ සඳහා චිත්‍ර තරගයේ දී මාළු වෙළෙන්දිය තෝරා ගැනීම.
ගසෙන් වැටීම නිසා කාන්තා මිය යාම.
සිරියාවතිගේ මව බයිසිකලයක හැපී ඔත්පල වීම
සමාජ බලපෑම් හමුවේ සිරියාවති අසරණ වීම ආදිය මෙහි සිද්ධි ගැළපීමට නිදසුන්ය.

**සිදුවීම් අතර සම්බන්ධය**

ගැමි සමාජයේ ස්වරූපය පිළිබිඹු කිරීම, සමාජයේ ඇති නැති පරතරය නිසා ඇතිවන ගැටුම් දැක්වීම ආදිය අවස්ථා නිරූපණය පැහැදිලි කිරීමේ දී වැදගත් වේ.

WWW.OLEVELAPI.COM

සමාජ පරතරය නිරූපණය කිරීමේදී පද්මා, වනසිංහ ධර්මරත්න වැනි ගුරු චරිත වැදගත් වේ. මෙබඳු සිදුවීම් ඇසුරෙන් කරුණු 3 ක් වත් දක්වමින් විස්තර ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

*(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන කරුණු 5 ක් හෝ ඉදිරිපත් කර ඇත්නම් අදාල ලකුණු පිරිනමන්න.)*

| | |
|---|---|
| උදාහරණ සඳහා ලකුණු | 03 |
| සමස්ත විස්තරයට ලකුණු | 07 |
| මුළු ලකුණු | 10 |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## ප්‍රශ්න අංක 07

7. ' 'සියාගෙත්තමියක නොවේ' කවි පෙළ නිර්මාණයේ දී, සමාජයෙහි විවිධාකාර සිදුවීම් සංයමයකින් යුතු ව නිරූපණය කිරීම කෙරෙහි කවියාගේ අවධානය යොමු වී ඇත.' කවි පෙළෙන් උදාහරණ තුනක් දක්වමින් මේ පිළිබඳ ව සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි)

*අපේක්ෂිත උත්තරය*

සියාගෙත්තමියක නොවේ කවි පෙළෙහි කතුවරයා විවිධ සිදුවීම් පාඨකයා හමුවට ගෙන එයි.

මේ සිදුවීම් මගින් සාමජයේ විවිධ අංග කෙරෙහි අවධානය යොමු කෙරේ. සමාජයේ දිළිඳු බව, කුහකත්වය, දුක්ඛදායකත්වය ඒනිසාම මතුවන භයානකත්වය, කවියා නිරූපණය කරයි.

වීදි සරනා මචක දුටුවෙමි.
මංසලෙන් සල නැගූ කොරණින්
මහරු සම්බුදු සිරිත දිස් විය
උවසු උවැසිය ගැයූ බැති ගී
අරම පිස වා ගැබට එක් විය
මවක් ඉකිබිඳ වැලපෙනා හඬ
පාලු විදිය වසා මතු විය

ආදී නිදසුන්වලින් මේ බව පැහැදිලි ය. මෙහිදී කවියා වර්ණනා අතරට මැදි වී ඒ ගැන විමර්ශනය කිරීමට ඉදිරිපත් නොවේ. ඒ වෙනුවට කවියා පසෙකට වී සමාජයේ විවිධ සිදුවීම් තෝරා ගෙන උපේක්ෂා සහගත ව ඉදිරිපත් කරයි. මේ තුළින් කවි පෙළෙහි සංයමය ඉස්මතු වේ. මෙබඳු නිදසුන් 3 ක් ඉදිරිපත් කරමින් කරුණු දැක්වීම ප්‍රමාණවත් ය.

WWW.OLEVELAPI.COM

උදාහරණ සඳහා ලකුණු 03
සමස්ත විස්තරයට ලකුණු 07
මුළු ලකුණු 10



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...